**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල - 2013**

---------------------------------------------------------

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, පළාත් පාලන සේවා අඥා පනතේ (264 අධිකාරිය) 62 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 අහිතකර මතය සඳහා පදනම

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ සමස්ථ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දායකත්වය රු. 79,250,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පරිගණක දත්ත පද්ධතියේ වියදම් වර්ගීකරණයට අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ සමස්ථ විශ්‍රාම වැටුප් වියදම රු.878,725,010 ක් වූයෙන් රු.799,475,010 ක විශ්‍රාම වැටුප් වියදම අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විගණන සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකිවිය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු දායක මුදල් යටතේ දැක්වෙන පළාත් පාලන ආයතනවලින් ලැබිය යුතු ශේෂය, ගණනය කිරීමට අදාළ කර ගත් බිල්කිරීමේ ලේඛනයට වඩා රු.62,897,485 ක් වැඩියෙන් දක්වා තිබුණි. එම වෙනස පැහැදිලි කිරීමට අවශ්‍ය විගණන සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ගිණුම්වල දක්වා තිබුණු රු.604,652 ක් වූ අගරු චෙක්පත් නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබූ අතර, එම චෙක්පත් පිළිබඳ විස්තර ලබාදී නොතිබුණි.

### 2.3 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති , රීති , රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති , රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක16 දරන පළාත් පාලන සේවා පනතේ 20 වගන්තිය හා 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 4:3 ඡේදය | පළාත් පාලන ආයතන විසින් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් වශයෙන් රු.1,521,417,434 ක් වූ හිඟ ශේෂය පළාත් පාලන සේවා පනතේ 20 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතනවලට ගෙවීමට ඇති යම් මුදලකින් අඩුකර ගැනීමට හෝ චක්‍රලේඛ උපදෙස් පරිදි ලබාගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1(අ) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2012 පෙබරවාරි 08 දිනැති අංක 01/2012 දරන චක්‍රලේඛය | ඒ ඒ මාසයේ මියයෑම් පිළිබඳ වාර්තා ඊළග මාසයේ 25 දිනට පෙර දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවීමට කටයුතු කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබු අතර ඒවා ගෙන්වා ගැනීමට ද පියවර ගෙන නොතිබුණි. |

**3 මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.25,118,987 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.25,963,371 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සසදන විට මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.844,384 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. මෙම පිරිහීමට දායක මුදල් ආදායම රු.15,494,385 කින් අඩුවීම හේතු වී තිබුණි.

**4 මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1 කාර්යසාධනය**

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන විශ්‍රාමික ගොනු ප්‍රදේශීය ලේකම් කාර්යාල සඳහා විමධ්‍යගත කිරීමට පෙර, විශ්‍රාමිකයින් සම්බන්ධ තොරතුරු හා ඔවුන් සේවය කළ ස්ථාන පිළිබඳ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් වාර්තාවන් සකස් කර නොතිබීම හේතුවෙන් නිශ්චිත තහවුරුවකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.223,836 ක් ද, පෙර වර්ෂයට රු.433,991 ක් ද මියයෑම් වශයෙන් දායක මුදල් ගිණුමට ගලපා තිබුණි.

(ආ) 2012 හා 2013 වර්ෂ සඳහා දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශයෙන් ලබාගත් දත්තයන් අනුව මියගිය පළාත් පාලන විශ්‍රාමිකයින් සංඛ්‍යාව 491 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගැලපීම් කර තිබුණේ මියගිය විශ්‍රාමිකයින් 183 දෙනෙකු පමණි. ඒ අනුව මිය ගිය විශ්‍රාමිකයින් 308 දෙනෙකු සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර දායකය ගණනය කිරීම් වලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මරණයට පත් වූ විශ්‍රාමිකයින්ගේ නම් ඉවත් නොකර දිගින් දිගටම පළාත් පාලන ආයතනවලට අදාල දායකය සකස් කිරීම නිසා වර්ෂයේ දායකයේ වටිනාකම වැඩියෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය.

**4.2** දායක මුදල් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂයේදී දායක මුදල් කිසිවක් ගෙවා නොමැති ප්‍රාදේශිය සභා සංඛ්‍යාව 123 කින් ලැබිය යුතු දායක මුදල රු.10,370,925 ක් විය.

**(ආ)** පසුගිය වර්ෂ කිහිපයක පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් හා එම වර්ෂවලට අදාල දායක මුදල් ගිණුම් ගත කිරීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | ගෙවූ විශ්‍රාම වැටුප් වටිනාකම රු. | වර්ෂයට ලැබුණ දායක මුදල රු. |
|---|---|---|
| 2010 | 940,060,460 | 129,981,285 |
| 2011 | 689,425,595 | 122,978,480 |
| 2012 | 837,302,193 | 119,863,371 |
| 2013 | 878,725,010 | 104,368,987 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

i. 2011 වර්ෂයේ විශ්‍රාම වැටුපට වඩා 2012 වර්ෂයේදී, රු.147,876,598 ක වැඩි වීමක් ද 2013 වර්ෂයේදී 2012 වර්ෂයට වඩා රු.41,422,817 කින් වැඩි වීමක්ද පෙන්නුම් කරන අතර වර්ෂයට අදාල දායක මුදල ක්‍රමයෙන් අඩුවීමක් පෙන්නුම් කෙරේ.

ii. පසුගිය වර්ෂ කිහිපය තුළ අවස්ථා කීපයකදීම විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කර තිබුණත් ඒ අනුව අයකරගත යුතු දායක මුදල් සංශෝධනය කිරීමක් සිදු කර නොතිබුණි

**5.** පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු අඩු පාඩු පිළිබඳව වරින්වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරවන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය
(ඇ) දායක මුදල්